දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

தென் மாகாணக் கல்வித் திணைக்களம்

**Southern Provincial Department of Education**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු**

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**සිංහල I**

**Sinhala I**

71 | S | I

පැය 03 විනාඩි 10

**Time: 03 hour & 10 min.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.**

- පළමුවැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න

(1) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) සහ (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න. )

(2)

(අ) ''එකල රජ්ජුරුවෝ ජීවකයන් කෙරෙහි අතිප්‍රසන්නව '' මේ මට අභ්‍යන්තරව ආත්මාරක්ෂාවට තරම් දෝ හෝ නොතරම් දෝ හෝ, තරම් වී නම් අභ්‍යන්තරව රක්ෂා කෙරෙමි. නොතරම් වී නම් පිටත ම තබා රක්ෂා කෙරෙමි''යි සිතා රාජමායමෙකින් ජීවකයන්ගේ තරම් පරීක්ෂා කරන්නාහු පන්සියයක් බිසෝවරුන් සර්වාභරණයෙන් සරහා රජගෙයි පිළිවෙළින් සිටුවා බොහෝ දෙනා රැස් කොට ජීවකයන්ගේ ගුණ කියා 'බිසෝවරිනි, මෙතෙක් දවස් තෙපි හැමදෙන මට බොහෝ වෙහෙසුම් කළෝ වේ ද, දැන් ඒ ව්‍යාධි සන්හිඳී ගියේය. මපුතුණුවන් ජීවකයන්ට තොප තොප පලන් සියලු පලඳනාවන් පුදව'' යි කීහ. එකෙණෙහි පන්සියක් බිසෝවරු තමන් තමන් පලන්පලන් දහස් ගණන් සනරන්පලඳනා ගලවා ජීවකයන් පෙරට රැස් කළහ. රුවන්පලඳනා ගොඩ ජීවකයන් උසටත් උස් විය. කළ මිල හා රුවන්කර්මාන්ත හැර සනරන් ම පන්ලක්ෂයක් පමණ විය. එවේලෙහි රජ්ජුරුවෝ ජීවකයන් මුහුණ බලා ''පුත, තෙල රත්නාභරණ තොපට ම දින්මි, හැරගන්ව'' යි කීහ. එවේලෙහි අභයරාජ කුමාරයෝ තමනුත් රජ හෙයින් රජ්ජුරුවන්ගේ අදහස් දැන''මේ පලඳනා මපුතණුවෝ ජීවකයෝ නොගත්හු නම් යහපතැ''යි සිතසිතා සිටියහ. රජුගේ අදහස් දන්නා අමාත්‍යයෝ ද ඔවුනොවුන් මුහුණ බලා එසේ ම සිතසිතා සිටියහ. ජීවකයෝ ද තුමූ ඔවුන් හැමටත් වඩා තමන් මහනුවණැති හෙයින් ඒ කාරණය දැන '' දේවයන් වහන්ස, මේ සැපතින් මට කම් නැත. බිසෝවරුන් වහන්සේ අත කර ලූ පලඳනා මා වැනියන්ට සුදුසු නොවෙයි. නුඹ වහන්සේගෙන් කරුණාසම්පත් දෙවා වදාළ මැනවැ''යි කියා නොඉවසූහ. එවේලෙහි රජ්ජුරුවෝ ද ''උත්තම පුරුෂයෙකැ''යි ජීවකයන් කෙරේ ඉතා පැහැද ඒ පලඳනා නැවත බිසෝවරුන්ට ම පාවා දී ජීවකයන්ට හවුරුදු පතා ලක්ෂ නිමන නියම්ගමක් හා පවුරු පදනමින් සුරක්ෂිත වූ අඹ උයනක් හා සිය ගණනින් පරිවාරජනයන් හා සත්බුමුමහපායක් ආදි වූ බොහෝ සම්පත් දී තමන් ඇතුළු වූ අන්තඃපුරයට හා බුදුන් ඇතුළු වූ මහාසංඝයාට පිළියම් කරන සේ ස්ථානාන්තර දී තමන්ට අභ්‍යන්තර කොට රක්ෂා කෙරෙති.''

(I) බිම්බිසාර රජතුමා ජීවකයන්ගේ සිතෙහි ස්වභාවය පරීක්ෂා කිරීමට යෙදූ උපක්‍රමය කුමක් ද?

(II) ජීවක වෛද්‍යවරයාගේ උත්තම භාවයට බිම්බිසාර රජතුමා උපහාර දැක්වූයේ කෙසේ ද?

(III) ''බුදුන් ඇතුළු වූ මහාසංඝයාට පිළියම් කරන සේ ස්ථානාන්තර දී'' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(IV) ''රත්නාභරණ'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1 × 4 = 04)



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

(ආ) ගල් පාවුළට ගිය කලට '' සොඳුර මෙතැන් පටන් තොප හා මා හා යත් මුත් සෙස්සන් ගෙනයන්ට බැරි ය. බොහෝ දෙනා ගෙන ගිය කල කසළත් කෙරෙති. නවතාලියත් නොහැක්ක. දෙන්න පමණෙක් යම්හ. දෙවියන්ට පුදන්ට ගෙන යන දෙය බැවින් පිදේනිය තොපි ම අල්වා ගනුව' යි කිවූ ය. උයිත් එලෙස ම කළහ. සොරාත් උන් කැඳවා ගෙන සොරුන් හෙළන ගල උඩට නැංගේ ය. ඒ ගලටත් එක් දසාවෙකින් මිනිස්සු නැගෙති. එක් දසාවක් ප්‍රපාත ව තිබෙන හෙයින් ගල් මුදුනෙහි සිටලා එතැනින් සොරුන් හෙළති. උ‍ෟ කඩ කඩ ව බිම හෙති. එහෙයින් ඒ ගලට''සොරපවුව'' යයි කියති. සිටුදුවණියෝ ද ගල මුදුනේ සිට 'බිලියම් කරන්නැ'යි කිවූ ය. ඒ බැණ නොනැගෙන්නේ ය. 'බැණ නොනැගෙන්නේ හැයි දැ' යි විචාළ හෙයින් 'මට බිලියමින් කම් නැත. බිලියම් පිට ලාලා තොප මෙතැනට ගෙනෙන පිණිස ය'යි කී ය. 'ගෙනායේ හැයි දැ'යි විචාළ කල්හි 'තොප මරාපියා ආභරණ හැර ගෙන පලායන්ට ය' යි කී ය

උ‍ෟ තුමූ බා ගොසින් 'ස්වාමීනි, මාත් ආභරණත් මුඹ සන්තක වුව මරන්නේ හැයි ද? ආභරණත් හැර ගත මැනව. මා අතිනුත් මෙහෙ හැර ගත මැනවැ' යි කිවූ ය. ඒ කෙසේ කිවත් නො ගිවිස ම මරන්ට ම තත්පර ව ගත, 'හැඟිවනු මැනව. මා මිය යාමෙන් ප්‍රයෝජන නැත. ආභරණ හැර ගෙන මාගෙනුත් මිඩිකම් හැර ගත මැනවැ' යි කිවූ ය.

(I) තම අරමුණ ඉටු කර ගැනීම සඳහා සිටු දියණියගේ ස්වාමි පුත්‍රයා කළේ කුමක් ද?

(II) සොර පව්වට ඒ නම ලැබුණේ ඇයි ?

(III) ''ඒ කෙසේ කීවත් නො ගිවිස ම මරන්ට ම තත්පර ව ගත'' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(IV) 'හැඟිවනු මැනව' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1 × 4 = 04)

(ඉ) එසඳ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනා ශබ්දය අසා පියසන් නොඇසෙන සේ සෙමෙන් සෙමෙන් අවුදින් ලියකිඳුරාණන් උන් නියාව ද නටමින් සිටි කිඳුරාඞ්ගනාවන් ද දැක පිළිබඳ වූ සිත් ඇති ව ''මේ කිඳුරා විද දිවි තොර කොට මැ හා සමඟ වාසය කෙළෙම් නම් යහපතැ'' යි සිතා සැඟවී සිට කිඳුරාට හීයක් විද්දේය. ඒ ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලේ දියෙන් මහත් වේදනාවෙන් මඬනා ලදුව හඬන්නේය '' සබඳ චන්ද්‍රිකාව මේ මාගේ ජීවිතය තව ද ආයු ඇති ව තිබිය දී සන්තතිවිච්ඡේදයෙන් නැසෙම්' යි සිතමි. එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නොඇලෙමි. ලද ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලෙහෙයෙන් රැඳී ඔත්තා වූ හා මාගේ ජීවිතය නොබෝ කලකින් කඳ සැඟවෙන්නේය. කකියා ගිය තලතෙලක ලූ තණ සෙයින් ද මුලින් සිඳ හෙලූ ගසක් සෙයින් ද නියං සමයෙහි පැන් සිඳී වියළී ගිය මළ හෝකඳුරක් සෙයින් ජීවිත විනාශයට පැමිණෙන සේ බලව '' පර්වතයක්හි වසන ලදුව ක්ෂණ ක්ෂණයෙහි වැහෙන්නා වූ වර්ෂා ජල ධාරාවක් සෙයින් ද කඳුළු වැහෙන්නට පටන් ගත්තේය.

(I) කිඳුරඞ්ගනාව දුටු බරණැස් රජුට ඇති වූ සිතුවිල්ල කුමක් ද?

(II) කිඳුරියගේ නැටුමෙන් කිඳුරා ට සතුටක් ලැබීමට නොහැකි වූයේ ඇයි?

(III) ''කකියා ගිය තලතෙලක ලූ තණ සෙයින් ''යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(IV) ''සන්තතිවිච්ඡේදයෙන් '' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1 × 4 = 04)

(ඊ) ගිය ජාතියෙහි ඒ කුමාරිකාවෝ යම් ක්‍රෝධයක් හේතු කොට ගෙන තමන් වැදූ මෑණියන්ට 'චණ්ඩාල කෙල්ල යැ'යි බිණුවාහු ද ඒ අකුසල කර්මය නිසා උත්තම ජනයන් විසින් පිළිකුල් කටයුත්තා වූ හීන ජාතියෙහි චණ්ඩාල ව උපන්හ. එම කාලායෙහි ඒ කුමාරිකාවෝ බුදුන්ගේ තුන් ලෙව්හි ව්‍යාප්තව සිටි නව අරහාදී වූ ගුණ ධර්මයන් සලකා යම් මල් පූජාවක් කළාහු ද ඒ කුශල කර්මයාගේ ආනුභාවයෙන් බැලු බැලූවන්ට ඉතා ප්‍රියකරු වූ මනෝඥ වූ රූ ඇති වූහ. මේ ලෝකයේ යම්කිසි කෙනෙක් යම් යම් ආකාරයකින් පින් පව් දෙක ම කළාහු වී නම් ඔහු තමන් විසින් කරන ලද්දා වූ ඒ ඒ කුශලාකුශල කර්මයට සුදුසු සුදුසු පරිද්දෙන් මනෝඥ වූ නානා වර්ණ වූ මොනරුන් මෙන් එහි විපාක ලබන්නාහු ම ය. මයුර ජාතීහු වනාහී පූර්ව ජන්මයෙහි කළ එක් අකුශලයකින්



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

තිරිසන් යෝනියෙහි උපදනාහ. අනෙක් කුශල කර්ම බලයකින් නානා වර්ණ ව ඉතා පැහැපත් වූ වර්ණ සෞන්දර්යයෙන් යුක්ත වෙති. එබැවින් මොනරුන් තිරිසන් යෝනියෙහි උපදනේ අකුශල කර්මයෙන් ම ය. නානා වර්ණ ව නොයෙක් පැහැයෙන් යුක්ත ව රූපත් ව උපදනේ පූර්ව ජන්මවල කළා වූ වෙන වෙන කුශල කර්මයෙන් ම යයි මෙසේ මොනරුන්ගේ කුශලාකුශල කර්ම විභාගය මෙකී පරිද්දෙන් දත මැනවි. එසේ හෙයින් කියන ලදී.

(I) ස්වර්ණතිලකාව රූපශ්‍රීයෙන් යුතු උත්පත්තියක් ලැබුවේ කෙසේ ද?
(II) අකුශල කර්ම විපාක දී ඇති අවස්ථා දෙකක් ලියන්න.
(III) ''ඒ අකුශල කර්මයාගේ අනුභාවයෙන් බැලූ බැලූවන්ට ඉතා ප්‍රියකරු වූ මනෝඥ වූ රූ ඇති වූහ'' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(IV) ''වර්ණ සෞන්දර්යයෙන්'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1 × 4 = 04)

(උ) සුරසෙන් ගෙන සැදි සුදම් ස බාවට
සතොසින් පැමිණෙන සුරිඳු සු බාවට
අවසන් නොව දිලි රුවන් ප බාවට
රජසෙන් සහ රජ පිවිස ස බාවට

සරා ලකළ කිරුළ'ග මිණි රැස් වැ ද
සරා උදය දිවයුරු බිඹු සිරි ල ද
පුරා උදුළ සේසත් සිහසුන් මැ ද
අරා පවර නරනිඳු වැඩ උන් ස ඳ

(I) රජු හා රාජ පිරිස රාජ සභාවට පැමිණියේ කෙසේ ද?
(II) උදය කාලයේ සූර්යයාගේ රශ්මිය මෙන් දිස් වූයේ කුමක් ද?
(III) ''පුරා උදුළ සේසත් සිහසුන් මැද'' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(IV) 'සුදම් සබාව' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 1 × 4 = 04)

- **(ඌ) සහ (එ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.**

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය ලියන්න.
(I) ''මා අවසර නැත. අනික් වෙද කෙනෙකුන් ගෙන්වා පිළියම් කරවන බව ය''
(II) ''ඔය සුදුමහත්වරුන්ගේ නෝනලාට ලැජ්ජා බය නෑ කියන එක ඇත්තක් ද?
(III) ''මේ ලැජ්ජා නැති මිනිසෙක, දැන් මා තද කොට කියා වැළකුව මැනව''
(IV) ''බඩගින්නේ ඉන්නව නම් මිනිහෙකුට නෙමේ සතෙක් සිවුපාවෙකුට උණත් කන්ඩ දෙනවා තියෙන හැටියට''
(V) ''දේවයෙනි මා නුඹ කෙරෙහි ඇති ප්‍රේම මෙතෙකැයි පමණ නොදනිමි''
(VI) ''තෙසු රජදරුවන් එවූ පඬුරු නොගෙන නුඹ වහන්සේ කෙරෙහි ස්නේහයෙන් ජීවත්වූයේ''
(VII) ''රැව් නොවේ ඇදුරිඳුට-මාගමුන් සහවාසේ'' (ලකුණු 3 × 4 = 12)


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(එ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයයෙහි සහ භාෂා ව්‍යවහාරයෙහි විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

තණ පඳුරක්මි
මතුවෙමි
බිම් ගැබින්
දුබල
නොගැඹුරු
මුල්
මතින්

තුරු
බොහෝ
උස් ය
මට
වඩා

ගැඹුරු
මුල් ඇතිව
වැඩී උස්ව
හිඳ
දකිති බොහෝ දුර
විඳිති
සුළං සුව

කැපෙති
අනතුරුව
වැටෙති
බිම
දිගට
නිෂ්ක්‍රියව

මැඬෙමි
ගෝ කුරෙන
ඉලෙමි
හොඹුවලින
ගව මහිස

වැඬෙමි
යළි සරුව
වදමි
දරු පිරිස
වසමි
එක පැහැර
හාත්පස (ලකුණු 12 යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(2) මිනිස් සන්තානයෙහි යථාර්ථය විදහා දැක්වීමත් ගැමි ජන ජීවිතයේ ඇසුරින් ලද උපමා භාවිතයත් තුළින් අපූර්ව කතා රසයක් ජනනය කිරිමට සද්ධර්මරත්නාවලි කතුවරයා සමත් වී ඇත. නියමිත කතා වස්තු ආශ්‍රයෙන් මෙම කියමන පැහැදිලි කරන්න.

**නැතහොත්**

'ස්ත්‍රිය' සමාජයේ බුහුමනට මෙන් ම නින්දාවට පාත්‍ර වන තැනැත්තියක් බව ප්‍රකාශ කිරීම ජාතකකථාකරුවාගේ අරමුණ වී ඇත. සුදුසු උදාහරණ ඉදිරිපත් කරමින් මෙම අදහස විමර්ශනය කරන්න. (ලකුණු 15 යි)

(3) කුශලාකුශල කර්ම පුද්ගල ජීවිතයට කරන බලපෑම මෙන් ම කුසල් රැස් කිරීමට මිනිස් සිත පෙලඹවීමට සද්ධර්මාලංකාර කතුවරයා සමත් වී ඇත්තේ කෙසේදැයි අදාළ කථාවස්තු ආශ්‍රයෙන් උදාහරණ දක්වමින් විභාග කරන්න.

**නැතහොත්**

සරල බස් වහර යොදා ගනිමින් අසිරිමත් සිදුවීම් විග්‍රහ කිරීමට ගුත්තිල කතුවරයා තුළ ඇත්තේ අපූර්ව කුසලතාවකි. සුදුසු උදාහරණ ඉදිරිපත් කරමින් විමර්ශනය කරන්න.

(ලකුණු 15 යි)

(4) (අ) දඹදෙනි යුගයේ සාහිත්‍ය ඉතිහාසය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 7 යි)

(ආ) අභව්‍ය සිදුවීම් විග්‍රහ කිරීමට මෙන්ම පුද්ගල චරිත සංවර්ධනයට සදුපදේශ ලබාදීමට පූජාවලි කතුවරයා සමත් වී ඇත්තේ කෙසේ දැයි අදාළ කථා වස්තු ඇසුරින් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

(5) පරිසරයේ කටුකත්වයට මුහුණ දෙමින් තම සහෝදරයාගේ පවුලේ සියලු දුක් දොම්නස් දරා ගැනීමට කර්ලිනාහාමි සමත් වී ඇත්තේ කෙසේදැයි බැද්දේගම නවකතාව ඇසුරින් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

(6) විවිධ සමාජ ස්තරයන්ගේ ස්වභාවය විශද කිරීමත් මිනිස් සිතෙහි ගැඹුරු තැන් ස්පර්ශ කිරීමටත් නූතන කෙටි කතාකරුවා සමත් වී ඇත්තේ කෙසේදැයි නියමිත කෙටිකතා තුනක්වත් ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

(ලකුණු 15 යි)

(7) "කවිය සඳහා විවිධ වූ ආකෘති භාවිතයට මෙන් ම විවිධ සමාජ ගැටලු විවරණය කිරීමට නූතන කවියා සමත් වී ඇත." උචිත පද්‍ය පන්ති තුනක්වත් ආශ්‍රයෙන් මෙම කියමන පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

(8) කාව්‍යාත්මක බස් වහරක් යොදා ගැනීමටත් එමගින් සංකීර්ණ චරිත නිරූපණයක් කිරීමටත් කතුවරයා සමත් වී ඇත්තේ කෙසේදැයි 'පෙමතො ජායතී සොකො' නාට්‍ය ඇසුරින් විමර්ශනය කරන්න. (ලකුණු 15 යි)

* * *



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Southern Provincial Department of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**සිංහල II**

**Sinhala II**

පැය 03 විනාඩි 10

**Time: 03 hour & 10 min.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.**

## I කොටස

(1) එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 සිංහල වර්ණ මාලාවෙහි එන ව , ෆ යන්න කුමන අක්ෂරයන් ද ?

(1) මූර්ධජ (2) කණ්ඨ තාලුජ (3) ඕෂ්ඨජ (4) දන්ත ඕෂ්ඨජ (.............)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න

(1) සුපිලිසන් , උද්ධච්ච , ස්වාද්‍යයනය , ලකළ
(2) ප්‍රබන්ද , නවීකරණ , තවළම , ජවනිකාව
(3) ශෝබාකුල , ප්‍රහේලිකා, ශ්වාශනාලිකා ,චීවරධාරී
(4) ග්‍රහක්ෂ, කෞශල්‍ය , ආසාදන , ඉලපත
(5) ක්‍රමානුකූල, නභෝගර්භ , ධවල , නිශ්ක්‍රීය (.............)

1.3 පහත සදහන් වරණ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) රකාරාංශය සහිත අකුරු යෙදෙන්නේ අකාරාදි පිළිවෙළහි ''ය'' යන්නට පසුවය.
(2) ප්‍රසංග + ඉක ප්‍රාසාංගික ලෙස යෙදීම නිවැරදිය.
(3) ව්‍යඤ්ජනයකට පරව හල්ව යෙදෙන ර් වෙනුවට රේඵය යෙදෙයි.
(4) අක්ෂර සදහා වරණ යන්න භාවිත නොවේ.
(5) යංශයට පූර්වයෙන් යෙදෙන ව්‍යඤ්ජන හල්කොට ලියයි. (.............)

1.4 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) දිනමිණ , සිළුමිණ , ලංකාදීප , මිහිර
(2) දවස , සතර , ලක්බිම , විදුසර
(3) දිවයින , සුබසෙත , ජනතා , අරුණ
(4) කිරිවෙහෙර, කතරගම, සංබපාල, දෙවුන්දර
(5) අභයගිරිය , තිස්සමහාරාම , ථූපාරාමය , දඹුල්ල (.............)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

1.5 රකාරාංශය, රේඵය, යංශය, කෙටි පාපිල්ල සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ස්වර්ගීය , ගෞතම , දුක්ඛ , රුධිරය (2) ප්‍රකට , කර්‍මය , යෞවන , රුහැන

(3) ආක්‍රමණ , වර්‍ෂීය , සත්‍ය , රුවල (4) ප්‍රදේශ , ධර්‍ම , ක්‍රමය , වැල්ල

(5) භෞතික , ප්‍රසිද්ධ , දිව්‍ය , වැස්ම (..............)

1.6 එකිනෙකට අනුරූපී වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) සොබා ධර්මය, ජලදහරා, කල්‍යාණමිතුරා, පිරිත් දේශනය

(2) විශේෂ දෙසුම , වෙසක් උලෙළ , අබිදම් , ගන අන්ධකාරය

(3) මිහි මඬල, යෞවන කටයුතු, තෑගි ප්‍රදානය, නැණවත් මනුෂ්‍යයෝ

(4) අමාත්‍ය මණ්ඩලය, ආනන්ද විද්‍යාලය , කර්තෘ වාක්‍ය, සමුද්‍ර බාදනය

(5) තෙවළා ධර්මය , සත්ත්ව උයන , නායක ස්වාමි, ත්‍රිපිටක ධර්මය (..............)

1.7 තත්සම වචන පමණක් අන්තර්ගත වරණය කුමක්ද?

(1) අපර , බාදනය , බෞද්ධ , මනහර (2) ආරාමය , මංගල්‍ය , ධාරාව , වෙහෙර

(3) නගර , ලෝක , දායක , නයන (4) කුලපති , ගජ, ආදර , අභිෂේක

(5) ආචාර , ජය , වාක්‍ය , පරිත්‍රාණ (..............)

1.8 මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) අභ්‍යන්තර - බාහිර, පිට, ඇතුළත, නොපිට

(2) සංවර - නොසන්සුන්, අසංවර, අසංයත, නොදැමුණු

(3) ස්ථිර - අස්ථිර, අස්ථාවර , නොතිර , අනිත්‍ය

(4) කළු - ශ්වේත , ශුක්ල , ධවල ,ශුභ්‍ර

(5) අල්ප - මහා , මහත් , ගොඩක් ,රුසක් (..............)

1.9 මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) ඉක්මන් - වහා, සෙද, විගස, යුහුසුලු (2) උතුම් - පවර, වර, අනගි, අනර්ඝ

(3) කැලෑව - වන, වල, අටවි, අරණ (4) ගිමන - ග්‍රීෂ්මය, විඩාව, සරතැස, අනල

(5) ජල - අඹ, දිය, උදක, සලිල (..............)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

1.10 විභක්ති, විශේෂණ, දකාරාර්ථ, අව්‍ය යන සමාසවලට අයත් පද පිළිවෙළින් ඇති පද පේළිය තෝරන්න.

(1) ඇත්දළ, නොමනා, සතුරුබිය, සුගත (2) වනමල්, අනාථාධාර, මුකුළු හිනා ,නිල් අහස

(3) කිරිබත්, බුදුගුණ, සුරමඟ, සොරබිය (4) තලතෙල්, පන්සිල්, රන්කම්, නොදුරු

(5) ගත්කරු, පාතඹර, අඹුදරු, නොමිනිස් (..............)

1.11 කෘදන්ත පදයක් අන්තර්ගත **නොවන** වරණය තෝරන්න

(1) නැටිලි, රැඳීම්, ලියමන්, බැලුම් (2) රැකුණු, මැරුණු, රැඳුණු, කෙරිලි

(3) රැකෙන, බැලෙන, දසත, රැඳෙන (4) පිවිසි, වදාළ, අතුළ, වැව්ලි

(5) වැනසිලි, සරසනු, වැඩුණු, වපුළ (..............)

1.12 පහත සදහන් වැකිවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ග පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

- දැරිය **හඬමින්** මව පසුපස දුවන්නීය.
- ගුරුතුමිය පන්තියට **ගොස්** පොත් බැලුවාය.
- අදත් **වැස්සොත්** ගංවතුර ගලයි.
- ගව්වෙන් ගව්ව දිව මාලිග **සෑදේවා !**

(1) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(2) මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශීර්වාද ක්‍රියා

(3) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(4) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, ආශීර්වාද ක්‍රියා

(5) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශීර්වාද ක්‍රියා (..............)

1.13 නිපාතයක් **නොවන** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) අනතුරු, යළි, ඊයෙ, සඳහා (2) නිබඳ, නිති, යළි, බල

(3) විනා, මිස, නිරන්තර, පැසුළු (4) සඳහා, ඉතින්, වස්, විනා

(5) හැර, මුත් , තව , පිණිස (..............)

1.14 උපසර්ගයක් යෙදී **නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) සුමඟ, උපයෝග, අතිශය, නිශ්චල (2) දුර්ගන්ධ, අනුස්මරණ, පරාජය, පවර

(3) උදුළ, පිරිපුන්, අභිමුඛ, අලස (4) නිශ්චල, ප්‍රබන්ධ, පිරිහුණ, නිසල

(5) අභිමාන, සුමිහිරි, අවිදු, සණස (..............)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) පවසද්දී, කරද්දී, බලද්දී, ගයද්දී (2) කළහ, බැලූහ, රැඳුණහ, ගියේ ය
(3) සාදවයි, කරවයි, ලියයි, දුවවයි (4) කරයි, හඬති, දැරුවේ ය, කියග
(5) ගොස්, පවසා, නරඹා, ලියමින් (..............)

1.16 සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) යානවාහන, වැඩකරු, ගම්වැසියා, සුගත (2) බුදුබණ, අනාථාධාර, තලතෙල, ගුරුඋපදෙස්
(3) පබල, පන්සිල්, මෙහෙකරු, හැඩකාර (4) සතුරුබිය, බඹදත්, ඉමිහිරි, අත්කම්
(5) මුවතඹර, දසබල, අනවශ්‍ය, ජනප්‍රිය (..............)

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(1) මෙහෙසුරු, ගිනියම්, පුනරුත්, බුත්සරණ (2) රුවනාර, මලසුන, උනුන්, ඔවුනොවුන්
(3) සද්දවස, වත්තල, උනුන්, මුනිතුමා (4) නළගන, මෙහෙසුරු, උනුන්, ඔවුනොවුන්
(5) ඉබ්බා, දුන්න, ඉන්නල, ගිරග (..............)

1.18 උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් සහිත වරණය තෝරන්න.

(1) ඇතැමෙක්, මිනිසුන්, මවක, පාලකයෙක් (2) පර්වතහු, මිනිසෙක්, දැරියක්, පාලකයෙකු
(3) ගුරුවරයෙක්, වැද්දෙකු, ඇතැමුන්, රීතීන් (4) දරුවන්, ඔවුහු, සේවිකාවක්, අපි
(5) සමහරුන්, කවුරු, ඇතැමෙකු, බාලිකාවක (..............)

1.19 ව්‍යාකරණානුකූලව නිවැරදි වැකිය තෝරන්න.

(1) ගංගාවෝ ගලා බසියි. (2) පන්තියේ සමහර අයෙක් නිදා වැටෙයි.
(3) සාමාජිකයින් ආවොත් අපි රැස්වීම පවත්වමු. (4) මිනිස්සු දහසක්වත් පැමිණේවි.
(5) ළමයි පාසල් නොඑන්නේ ඇයි? (..............)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.

(1) එයා වත්ත පහළට ගිහින්. (2) යමක් හොඳින් කළොත් එය සාර්ථකයි.
(3) වැරදි වැඩවලින් මිදී සිටිමු. (4) අර එක්කෙනා මොනව කරල ද මං දන්නෑ.
(5) පැත්තකට වෙලා යමක් කියල නොවැ. (..............)

(ලකුණු 20 යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## II කොටස

- මෙම කොටසින් 2 , 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

(2) (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මුළු මහත් සිංහල ජාතිය සතුව පැවති නිර්මාණ ශක්තිය කලා කෞශල්‍යය සහ කාර්මික ඥානය කෙබඳු වූයේ දැයි විදහා දැක්වෙන සංකේතයකි. සීගිරිය, දුටුවන් බියට පත් කරවන පර්වත කූටයක් යවුලින් බිඳ ඒ පර්වතයෙහි සිසිල් දිය පිරි ළිං පොකුණු ආදියෙන් හෙබියා වූ ද විචිත්‍ර චිත්‍ර ශාලාවෙකින් සමලංකෘත වූ ද වාස භවනයක් සහිත බළකොටුවක් තමා රජ කළ වර්ෂ කිහිපය තුළ දී ඉදි කළ කසුප් රජතුමාට අපේ බෞද්ධ සාහිත්‍යයේ සඳහන් විශ්වකර්මයා වුව ද හිස නමා ආචාර කරනු නොඅනුමාන ය. කාලයාගේ නිරන්තර උපද්‍රව මතු කොට විනාශකාරී පුද්ගලයන්ගේ නිහීන ක්‍රියා ද අබිබවා පැවතෙමින් ලොව දස දෙසින් පැමිණෙන කලා රසිකයන් විස්මයානුකූල අමන්දානන්දයට පත් කරන ලෝක ප්‍රකට සීගිරි ලෙන් සිත්තම් ඇත්තේ එහි එක් චිත්‍රාගාරයෙක ය. සීගිරියේ බටහිර අගාරයේ කැටපත් පවුරේ සූක්ෂම ලෙස කොටා තිබෙන කුරුටු ලිපි ද එතරම් ම අගනේය. සාහිත්යික වටිනාකමකින් ද යුක්තය. ක්‍රි. ව. 10 සියවස්හි සීගිරිය නැරඹීමට පැමිණියවුන්ගේ සිත් තුළ ජනිතවූ රස භාවයන් ද විවිධ චින්තා ද මේ ලිපිවලින් කාලය පරයමින් වාර්තා කෙරෙයි. පවුරු තලය මත සියුම් සේ සටහන් කොට ඇති මේ ගී එදා ලක්දිව පොදු ජනයා අතර පැවති සිතුම් පැතුම් සහ අධ්‍යාපන තත්ත්වය මොනවට විදහා පායි. සිංහල භාෂාවේ අක්ෂරවල වර්ධනය හඳුනාගැනීමට ද මහෝපකාරී වන මේ කුරුටු ගී ලිපි අතර සීගිරි ලෙන් සිත්තම්වල සුන්දරත්වයෙන් උදම් වූවන්ගේ ද සිංහ වාසලෙහි අසිරියෙන් කුල්මත් වූවන්ගේ ද සිතිවිලි පමණක් නොව අන්‍යයන් විසින් කරන ලද පූර්ව ලිපිවලට පිළිතුරු වශයෙන් කරන ලද සටහන් ද ඇත.

I සීගිරියේ ශ්‍රේෂ්ඨත්වය විදහා දැක්වීමේදී මේ ලේඛකයාගේ අවධානය යොමු කෙරෙන අංග මොනවාද?

II සීගිරි කුරුටු ලිපිවල වස්තු විෂය සඳහා පාදක වී ඇත්තේ කෙබඳු කරුණු ද?

III සීගිරි කුරුටු ලිපි මගින් හෙළි කෙරෙන විශේෂ ලක්ෂණ මොනවාද?

IV සීගිරියේ පවත්නා අගාරවල සුවිශේෂත්වය කුමක් ද?

V කසුප් රජතුමාට විශ්වකර්මයා පවා හිස නමා ආචාර කරනු ඇතැයි මේ ලේඛකයා පවසන්නේ කවර හේතුවක් නිසාද?

VI සියුම් ලෙස කොටා ඇති අගනා කුරුටු ලිපි දැකිය හැක්කේ සීගිරි කැටපත් පවුරේ කුමන දිශාවකින්ද?

(ලකුණු 2×6=12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ලෝකය ඇතිවීම පිළිබඳව විශ්ව සම්භවය කෙසේ ඇතිවී ද යන්න පිළිබඳව විද්‍යාඥ මනසින් විද්‍යාඥ පර්යේෂණවලින් මේ දක්වා කිසිම විද්‍යාඥයෙකු හෝ විද්‍යාඥ කණ්ඩායමක් හෝ පැහැදිලි නිගමනයකට හෝ සත්‍ය නිගමනයකට බැස නැත. එසේ පැහැදිළි නිගමනයකට බැසීමට ඔවුන්ට හැකියාවක් ලැබෙන්නේ ද නැත. ලෝකයේ අගමුල සෙවීමට ගිය තැන විද්‍යාඥයා මහා අගාධායකට වැටේ. එතැනින් එහාට ඔහුට යාමට නොහැකිය. සංයුක්ත නිකායේ දේවපුත්ත සංයුක්තයේ රෝහිතස්ස සූත්‍රයේදී බුදුන් වහන්සේ පැහැදිලි කළේ අසීමිත සෘද්ධි බලවතෙකු වූ රෝහිතස්ස සෘෂිවරයා වසර සියයක් තමන්ගේ සෘද්ධි බල මහිමයෙන් විශ්වයේ කෙළවර සෙවීමට ගොස් විශ්වයේදී ම මිය ගිය බවය. එසේ ම ලෝකයෙහි කෙළවර සෙවීමේ අටියෙන් විශ්ව තරණයෙහි යෙදුණු නානා ලෝකධාතුවලට ගමන් කරමින් එම ලෝකවල සත්ත්වයන්ගේ තතු සියැසින් දුටු මහාර්ධිභාව සම්පන්න මුගලන් මහරහතන් වහන්සේට ද ප්‍රත්‍යක්ෂයෙන් ලෝකධාතුවල හෙවත් විශ්වයෙහි පරතෙර දැක ගැනීමට අවශ්‍ය විය. උන් වහන්සේ ලෝකයෙහි කෙළවර සෙවීම පිළිබඳ අසාර්ථක ප්‍රයත්නයක යෙදුණහ. මෙම අසාර්ථක ප්‍රයත්නය දුටු බුදුන් වහන්සේ මුගලන් හිමියන් තමන් වහන්සේ වෙතට කැඳවා අනන්ත වූ අවකාශය හි කෙළවරක් නොමැති බැවින් හා කිසිම දිනක කිසිවෙකුට එහි කෙළවරක් සොයා ගැනීමට නොහැකි බව පැහැදිලි කරමින් විශ්වයේ කෙළවර සෙවීමේ අති භාරදූර කාර්යය හුදෙක් නිෂ්ඵල ප්‍රයෝජනයක් පමණක් බව පෙන්වා දුන්හ.

(ලකුණු 13 යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(3) දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනයක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

I වර්තමානයට ගැළපෙන පරිදි ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නවීකරණය විය යුතුය.

II අද්‍යතන සාහිත්‍ය නිර්මාණ සහ එහි භාෂාව.

III ශ්‍රී ලංකාවේ බුද්ධි ගලනය නිසා අනාගතයේ දී මතු විය හැකි ගැටලු.

IV නූතන ජනසන්නිවේදන මාධ්‍ය මගින් සමාජයට කෙරෙන බලපෑම.

V සමාජ සාරධර්ම හා තරුණ පරපුර. (ලකුණු 25)

(4) (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

I බුද්ධිමත් ළමයා සැම විටම දක්ෂ විචාරකයෙකු ද වෙයි.

II අපි හැකි සැමවිටම අසරණයන්ට පිහිට වීම වටී.

III සරසවි සිසුන් පාරට බසිති' යි අප දැන සිටියෙමු.

IV සේවකයන් රැස් වන්නේ කවදා ද?

V දෙමව්පියෝ දරුවන් හා දඹදිව වන්දනා කරයි. (ලකුණු 1×5=5)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

I භාෂාවේදියෝ එදා සමුළුවේ දී මහාචාර්යවරුන් හමු වූහ.

II අතීත මහරජවරු සයුර පරයන මහ වැව් සෑදූවෝය.

III උපාසකයා බණ පොත පෙරළා බලයි.

IV රියදුරු බසයේ කාර්මික දෝෂය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.

V ගොවියා වගාව විනාශ කළ රිළවෙකු පැන්නුවේය. (ලකුණු 1×5=5)

(ඉ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන තුළින් තෝරා ලියන්න.

I නාට්‍ය (ශිල්පීන්/ශිල්පියෝ ) වනාහී මනහර හැඟීම් (මවන්නෝ/මවන්නන්) යැයි හඳුන්වා දෙති.

II (මවක්/මවක) විසින් (දරුවෙක් /දරුවෙකු) සනසනු ලබයි.

III ගණිත(ගුරුවරයෙකු/ගුරුවරයෙක්) සොයා දෙන ලෙස මට (මිතුරියක්/මිතුරියක) කීවාය.

IV වියරණ (රීතීන්/රීති) නිවැරදිව (අප/අපි) අනුගමනය කළ යුතුය.

V කොග්ගල ප්‍රාඥයා (හෙවත්/නොහොත්) මාර්ටින් වික්‍රමසිංහ සාහිත්‍යකරණයේ (යෙදුණහ/ යෙදුණේය)

(ලකුණු 1×5=5)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

(5) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංග දක්වා ඇත ඒවායෙහි අනු අංග දක්වන්න.

I **විලෙහි** පිපි **සියපත්** වටා **රඟන** බිඟුන්ගේ නද සවන් සනහාලයි.
(විලෙහි - විභක්ති, සියපත් - සමාස, රඟන - කෘදන්ත)

II ශිෂ්‍යයෝ **ඔවුනොවුන්** දෙස **බලමින් ප්‍රයෝජනවත්** යමක් කතා කළහ.
(ඔවුනොවුන්- සන්ධි , බලමින් - ක්‍රියා, ප්‍රයෝජනවත් - තද්ධිත )

III වීණා නාදයේ **සුමිහිර** විඳි ඇතුන් **සිතියම්** ඇන්දා **මෙන්** නොසෙලවී සිටියේය.
(සුමිහිර- උපසර්ග, සිතියම් - සන්ධි, මෙන් - නිපාත )

IV ජාතියේ **අභිවෘද්ධිය** වෙනුවෙන් කටයුතු **කරන** නායකයන් දෙවියෝ **රකිත්වා!**
(**අභිවෘද්ධිය**-උපසර්ග, **කරන** - කෘදන්ත, **රකිත්වා** - ක්‍රියා)

V ගුවන් යානය ජනාකීර්ණ ප්‍රදේශයකට පතිත **වෙද්දී** එය මගහරවාගත් **නියමුවාණෝ බැතින්** අගයමු.
(වෙද්දී - ක්‍රියා , නියමුවාණෝ - තද්ධිත, බැතින් - සන්ධි )

(ලකුණු 3×5=15)

(6) (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න

I ගඟ දෙපස මලින් සැදී ගිය ලිය..................... කැරගල ප්‍රදේශය අලංකාර කළේය.

II කුමාරතුංග මුනිදාස මහතා දෙස..................... සුරැකීමේ පුරෝගාමියා විය.

III සංස්කෘත, පාලි ..................... සිංහල භාෂාව සුපෝෂණය කිරීමට ඉවහල් විය.

IV යුරෝපයේ පැවැත්වෙන ආර්ථික සම්මේලනය වෙනුවෙන් අමාත්‍ය .....................දිවයිනෙන් පිටත්වේ.

V නිදහස් දිනය සැමරීමේ .....................උත්සවය මෙවර චාම් අන්දමින් පැවැත්වීමට කටයුතු කර තිබුණි.

VI උපාධි.....................ය බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.

(ප්‍රධාන, මණ්ඩලය, බස, ප්‍රදානෝත්සවය, භාෂා, මඩුලු ) (ලකුණු 1/2×6=3 යි)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

| | | | |
|---|---|---|---|
| I | උච්ච + අවස්ථාව | IV | නැටිලි + අ |
| II | නො + එන | V | තුන් + මහක් |
| III | අනු + ඒෂණ | VI | දෙ + අමුණ |

(ලකුණු 1/2×6=3 යි)

(ඉ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

I වී **පැදුරෙන්** ඉගිලී යන **කුරුල්ලෙකු** ලෙසින්.

II **තරුණයනි, රටෙහි** ගෞරවය රකින්න.

III **මාධ්‍යවේදීන්** විසින් රටේ තොරතුරු ජනතාවට නිවැරදිව ලබා දෙන ලදී.

(ලකුණු 1/2×6=3 යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

I යෝදියේ නුඹට ඔල්මාදෙ ද අම්මා බෙරිහන් දුන්නාය

II අයියෝ ළමයගෙ අනාගතේ ම ඉවරයි

III උදේ 9 30 ට පිටත්ව ගියේ ය (ලකුණු 1/2×6=3 යි)

(උ) පහත දැක්වෙන ප්‍රකෘතිවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

I ඉරිදා දින විදුලිය කපනවා යැයි විදුලිබල මණ්ඩලය ප්‍රදේශවාසීන්ට නිවේදනය කළේය.

II මල්ලී අඹ ගසින් බසින්න අක්කා පැවසීය.

III අපි විභාගය සමත් වෙනවා යි උසස් පෙළ ළමයි කියා සිටියහ.

(ලකුණු 1/2×6=3 යි)

(7) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අධ්‍යාපනික හා **පර්යේෂණ** කටයුතු සඳහා සිංහරාජවනයට පැමිණෙන දේශීය හා විදේශීය පුද්ගලයින් සංඛ්‍යාව මෑතක සිට ඉතා **ශීඝ්‍රයෙන්** ඉහළ ගොස් ඇති අතර ඔවුන්ට අවශ්‍ය **පහසුකම්** සැපයීම සඳහා ද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විවිධ ක්‍රියාමාර්ග සලසමින් තිබේ. **නවාතැන්** පහසුකම් මාර්ග පහසුකම් වැඩි දියුණු කිරීම ආදිය මේවා අතර කැපී පෙනේ. සිංහරාජය වටා ඇති ගම්මානවල ග්‍රාමෝදය සමිති මගින් ඔවුන්ගේ සහය ලබා ගැනීම ද සිදු කරයි. අධ්‍යාපනික හා ව්‍යාප්ති වැඩ සටහන් ඔවුනොවුන් එක්ව පුළුල් ලෙස ක්‍රියාත්මක කරයි. ස්වභාව ධර්මයේ විස්සම් රටා මවන සිංහරාජ වනය රැක, අනාගත ජීවිතවලට එහි පහස විඳින්නට ඉඩ **හැරීම** කාගේත් යුතුකම ය.

I ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

II ග්‍රාමෝදය, විදේශීය, සිදුකරයි යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙනම ලියන්න.

III ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. රකාරාංශය හා තාලුජ අක්ෂරයක් සහිත වචනයක්
2. ඌෂ්ම අක්ෂර දෙකක් එක ළඟ පිහිටි වචනයක්
3. අඝෝෂ ව්‍යංජන අක්ෂරයක් හා යංශය සහිත වචනයක්

IV පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.

ග්‍රාමෝදය, ඔවුනොවුන්, විස්සම්

V පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න

පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , වර්තමාන කාල ඒකවචන ක්‍රියා (ලකුණු 3×5 =15)

(8) පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

I කර්තෘකාරක වාක්‍ය

II කරණ විභක්තිය

III අසම්භාව්‍ය ක්‍රියා

IV ගාත්‍රාක්ෂරලෝප සන්ධිය

V මහප්‍රාණ අක්ෂර

(ලකුණු 3×5 =15)

* * *



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය**

**දෙවන වාර පරීක්ෂණය 2020 මාර්තු**

**සිංහල - I** **13 ශ්‍රේණිය**

**Sinhala - I**

# පිළිතුරු පත්‍රය

(1) (අ) I අන්තඃපුරයේ පන්සියයක් බිසෝවරුන්ගේ ස්වණාභරණ පළඳනා සියල්ල ම ජීවක වෛද්‍යවරයාට පුද කිරීම

II අවුරුදු පතා ලක්ෂයක ආදායම ලැබෙන පරිදි ගම්වරයක් (නියම් ගමක්) පවුරු පදනම් සහිත සුරක්ෂිත අඹ උයනක් සිය ගණන් පරිවාර ජනයා හා සත්මහල් ප්‍රාසාදයක් ලබාදීම. බුදුන් ඇතුළු මහා සංඝයාගේ වෛද්‍යවරයා බවට පත් කිරීම.(මෙයින් කරුණු දෙකක් තිබිය යුතුයි ඒත් ලකුණක් ප්‍රදානයට)

III බුදුන් වහන්සේ ඇතුළු මහා භික්ෂූන් වහන්සේලා සියලු ම දෙනාට ප්‍රතිකාර කරන වෛද්‍ය තනතුර පිරිනැමීම

IV රුවන් ආභරණ, රුවන් / රත්න මැණික්වලින් කරන ලද ආභරණ

(ආ) I සොරා බිලි පූජාවක් දීමට අවශ්‍ය යැයි සිටු දුවණිය පමණක් සොර පව්වට රැගෙන ගොස් ඇයව සොර පව්වෙන් බිම හෙළා ආභරණ රැගෙන පලා යාමට

II සොර පව්වේ එක පැත්තක ප්‍රපාතයක් (බෑවුමක් ,හෙළක් ) ඇති නිසා ගල මුදුනේ සිට සොරුන් පහළට හෙළා මරණ නිසා

III කොතරම් කරුණු පහදා කිව්වත් පිළිගන්නේ නැතිව මරනවා යන අදහසෙහි ඇලී ගැලී සිටීම

IV සලකා බැලුව මැනව හැඟී යනු හැඟීම, සැලකීම, හැකිවනු යන්න සැලකීමක් කර බලනු යන අදහසයි. මැනව යනු යහපත් යනු යි.

(ඉ) I කිඳුරා විද මරා කිඳුරිය සමඟ එකට වාසය කිරීමේ සිතුවිල්ල

II බරණැස් රජතුමාගේ ඊතල ප්‍රහාරයෙන් කිඳුරා ලේ වගුරවමින් මරණාසන්නව වැතිරී සිටි නිසා,

III අතිශයින් ම උණු වූ තල තෙල්වලට දැමූ තණකොළ ගසක් වගේ

IV සිතේ නොකැඩී පවතින සිතුවිලි පරම්පරාව සිඳීමෙන් සන්තති යනු නොකැඩී පවතින චිත්ත චෛතසික ආදී පරම්පරාවයි. විච්ඡේදනයෙන් යනු සිඳීමෙන් යන අරුත දෙයි.

(ඊ) I තුන් ලෝකයේ ම පැතිරී ගිය බුදුන් වහන්සේගේ නව අරහාදී බුදු ගුණ ධර්මයන් වෙනුවෙන් කළ මල් පූජාවේ පින් මහිමය නිසා

II ස්වර්ණතිලකා වැදූ මවට චණ්ඩාල කෙල්ල යැයි බැණීම නිසා චණ්ඩාල කුලයේ ඉපදීම

මොනරා ලස්සන වුවත් තිරිසන් ජන්මයක උත්පත්තිය ලැබුවේ පෙර කළ අකුසල කර්මයක් නිසා ය

III කරන ලද පින්වල අනුහසින් බලන බලන අයට ඉතා ලස්සන වූ සිත් ඇදගන්නා වූ රූපයක් ඇතිවීම

IV රූපයේ සුන්දරත්වය, පැහැයෙහි පැහැපත් බවෙන්, පැහැය නිසා රූපයේ ඇතිවන සුන්දරත්වය වර්ණ සෞන්දර්යයි.

(උ) I දෙවියන් ශක්‍රයා සමඟ සුදම් සබාවට පැමිණෙන ආකාරයෙන්,



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

II රජුගේ ඔටුන්නේ අග රැඳුණ මාණික්‍යයේ ආලෝකය,

III ඉතාමත් හොඳින් බබළන්නා වූ සුදු කුඩයක් සිංහාසනය මැද එල්ලා ඇති බව,

IV සුධර්මා නම දිව්‍ය සභාව, ශක්‍ර දේවේන්ද්‍රයා දෙවිවරුන් සමඟ රැස්වන්නේ සුදම් සබාවේ දී ය. පුර පසළොස්වක් දිනයන් හී දී රැස් වී සතර වරම් දෙවිවරුන්ගෙන් මිනිස් ලොව තතු විමසයි.

(ඇ) I දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී කථා වස්තුවෙන් උපුටා ගන්නා ලදී. මට්ටකුණ්ඩලීට පාණ්ඩු රෝගය වැළඳී හොඳට ම අසාධ්‍ය වූ මොහොතේ පැමිණි වෛද්‍යවරයා විසින් අදින්නපුබ්බක බමුණාට මෙසේ ප්‍රකාශ කරන ලදී.

II ලෙනාර්ඩ් වුල්ෆ් මහතා විසින් රචිත (විලේජ් ඉන් ද ජන්ගල්) කෘතිය ඒ.පී. ගුණරත්න මහතා විසින් සිංහලට අනුවර්තන කරන ලද බැද්දේගම නව කතාවේ සත්වන පරිච්ඡේදයෙන් උපුටා ගන්නා ලදී. ප්‍රනාන්දු මුදලාලි බැද්දේගමට පදිංචියට පැමිණ ගම් ප්‍රදේශයේ ඇවිදිද් දී බබුන්ගේ පැලටත් ගොඩ වී ඔහු කොළඹ දී ගත කළ ජීවිතයේ ස්වභාවය බබුන්ට හා පුංචි මැණිකාට විස්තර කළ අවස්ථාවේ එයින් පුදුමයට පත් පුංචි මැණිකා විසින් ප්‍රනාන්දු මුදලාලිගෙන් මෙසේ අසන ලදී.

III ගම්පොළ යුගයේ දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාර කෘතියේ නන්දි වාණිජ වස්තුවෙන් උපුටා ගන්නා ලදී. සිව අමාත්‍යවරයා නන්දිය වෙළෙන්දාගේ භාර්යාවට සේවිකාවක් අත පඬුරු දී තම කාමුක අදහස කියා යැවීය. එසේ පඬුරු දී එවූ සතර වන වාරයේ දී නන්දිය වෙළෙන්දාගේ භාර්යාව විසින් පණිවිඩය ගෙන ආ කෙල්ලට තම අකමැත්ත මෙසේ ප්‍රකාශ කරන ලදී.

IV සෝමරත්න බාලසූරිය මහත්මා විසින් රචනා කරන ලද කරත්තය නම් කෙටි කතා සංග්‍රහයේ 'කරත්තය'' කෙටි කතාවෙන් උපුටා ගන්නා ලදී. ත්‍රස්තවාදීන්ට කෑම දුන්නා යන චෝදනාව මත සැකකරුවෙකු ලෙස පොලිස් ස්ථානයට රැගෙන ආ කරත්තකරුවෙකු වන රණසිංහට පොලීසියේ දී හොඳින් ගුටි බැට දී සිර කුටියේ දමා පසුව දා පොලීසියේ ඕ අයි සී මහතා 'තමන් ත්‍රස්තවාදීන්ට කෑම දුන්නා දැ'යි ඇසූ පැනයට කරත්තකරු වන රණසිංහ විසින් ඕ. අයි. සී. ට මෙසේ ප්‍රකාශ කරන ලදී.

V දඹදෙණි යුගයේ මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචනා කරන ලද පූජාවලිය කෘතියේ අනුරුද්ධ කුමාර වස්තුවෙන් උපුටා ගන්නා ලදී. අනුරුද්ධ කුමාරයාගේ මෑණියෝ තම පුතු මහණ වනවාට අකමැති නිසා ඔහුගේ යහළුවා වන භද්දිය රජතුමා හමුවීමට යැවීය. අනුරුද්ධ කුමාරයා විසින් භද්දිය රජතුමාට මහණවීමට යාමට කැමති කරවා ගැනීමේ අරමුණින් මෙසේ ප්‍රකාශ කරන ලදී.

VI කුරුණෑගල යුගයේ දී සතරවන පරාක්‍රමබාහු රජ දවස රචනා කරන ලද පන්සිය පනස් ජාතක කතා පොතේ චන්දකින්නර ජාතකයෙන් උපුටා ගන්නා ලදී. බුදුන් බුදු බව ලබා පළමු වරට සුද්ධෝදන රජුගේ මාළිගාවට වැඩි අවස්ථාවේ සුද්ධෝදන රජතුමා විසින් යසෝදරා දේවියගේ ගුණවත් බව බුදුන් වහන්සේට ප්‍රකාශ කරන ලදී.

VII මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් රචනා කරන ලද පෙමතො ජායතී සොකො නාට්‍යයෙන් උපුටා ගන්නා ලදී. උත්තර මධුරා පුරයේ සිට පංචමධුරා පුරයට පැමිණි සැඩොල් බමුණා හා ස්වර්ණතිලකා උද්දාල බමුණාගේ සිප්හලට වැරදීමකින් පැමිණෙයි. එහි දී දප්පුල විසින් ආපසු යන්ට සැරසෙන ස්වර්ණතිලකාට හා ඇගේ පියා වූ බමුණාට මෙසේ ප්‍රකාශ කරන ලදී.

ලකුණු ප්‍රදානය කිරීම

පොත හා කර්තෘවරයාට - ලකුණු 01

කවුරුන් විසින් කාහට - ලකුණු 01

අවස්ථාවට - ලකුණු 01

(රසාස්වාදයට ලකුණු ප්‍රදානයේ දී පද්‍ය පන්තිය සමස්තයක් ලෙස ගෙන භාෂා ලක්ෂණ ආදිය ගැන ලියා ඇත්නම් ඉහළ ලකුණක් ප්‍රදානය කරන්න. කවිය ලියා තේරුම ලියා ඇත් නම් ප්‍රදානය කළ හැකි උපරිම ලකුණ හයට අඩු බව සලකන්න)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

# සිංහල II I කොටස

| | | | |
|---|---|---|---|
| 1.1 - 4 | 1.6 - 4 | 1.11 - 3 | 1.16 - 3 |
| 1.2 - 4 | 1.7 - 3 | 1.12 - 5 | 1.17 - 2 |
| 1.3 - 1 | 1.8 - 1 | 1.13 - 2 | 1.18 - 1 |
| 1.4 - 5 | 1.9 - 4 | 1.14 - 5 | 1.19 - 3 |
| 1.5 - 3 | 1.10 - 5 | 1.15 - 1 | 1.20 - 3 |

( ලකුණු 20 යි)

(2)(අ) I සීගිරි කුරුටු ලිපි ,කාර්මික ඥානයෙන් කළ ඉදිකිරීම් හා සීගිරි චිත්‍ර.

II සිංහල ජාතිය සතු නිර්මාණ ශක්තිය කලා කෞශල්‍ය හා කාර්මික ඥානය.

III ජනයා අතර පැවති සිතුම් පැතුම් අධ්‍යාපන තත්ත්වය.

සිංහල භාෂාවේ අක්ෂරවල වර්ධනය

IV සුක්ෂමව කොටා ඇති කුරුටු ලිපි ආගාරවල පැවතීම.

V මහා පර්වතයේ යකුළින් වේ ද ඒ පර්වතයේ සිසිල් දිය පිරි ළිං පොකුණු හා විචිත්‍ර චිත්‍ර ශාලාවක් සහිත බලකොටුවක් සෑදීම නිසා.

VI සීගිරියේ බටහිර අගාරයේ (ලකුණු 2 × 6 =12)

(ආ) සාරාංශය සඳහා ලකුණු 13 යි.

සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට ලකුණු 02 යි.

අක්ෂර වින්‍යාසයට ලකුණු 03 යි.

අන්තර්ගතයට ලකුණු 08 යි.

(වචන ගණන 50-60 අතර තිබිය යුතුය)

(3) රචනය සඳහා ලකුණු 25 කි.

වචන ගණන 400 ට වැඩි වේ නම් හෝ 250 ට අඩු වේ නම් හෝ ලකුණු 03 ක් අඩු කළ යුතු වේ.

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකරන්න.

I රචනය සඳහා තෝරාගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශිකරණය

II එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරිම

III කරුණුවල පැහැදිලි බව

IV නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම

V ව්‍යාකරණ දෝෂ රහිත වීම

VI භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම

VII සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරිම

VIII කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලිවීම



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(4)(අ) I බුද්ධිමත් ළමයා සැමවිටම දක්ෂ විචාරකයෙක් ද වෙයි.

II අප හැකි සැම විටම අසරණයින්ට පිහිට වීම වටී.

III සරසවි සිසුන් පාරට බසිති' යි අපි දැන සිටියෙමු.

IV නිවැරදි වාක්‍යයකි.

V දෙමව්පියෝ දරුවන් හා දඹදිව වන්දනා කරති. (ලකුණු 1×5 = 05)

(ආ) I භාෂාවේදීන් විසින් එදා සමුළුවේදී මහාචාර්යවරු හමුවනු ලැබුහ/ලදහ.

II අතීත මහරජවරුන් විසින් සයුර පරයන මහ වැව් සාදන ලදී/සදනු ලැබීය/සැදිණි.

III උපාසකයා විසින් බණ පොත පෙරළා බලනු ලබයි/ බැලේ.

IV රියදුරු විසින් බසයේ කාර්ක දෝෂය පිළිබඳ කරුණු ඉදිරිපත් කරනු ලබයි/ලැබේ/කෙරේ.

V ගොවියා විසින් වගාව විනාශ කළ රිළවෙක් පන්නනු ලැබුවේය/පන්නන ලදී/ පන්නන ලද්දේය.

(ලකුණු 1×5 = 05)

(ඉ) I ශිල්පියෝ - මවන්නෝ  II මවක - දරුවෙක්

III ගුරුවරයෙකු- මිතුරියක්  IV රීති - අප

V හෙවත් - යෙදුණේය (ලකුණු 1×5 = 05)

(5)

| වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|
| I විලෙහි<br>සියපත්<br>රඟන | විභක්ති<br>සමාස<br>කෘදන්ත | ආධාර විභක්ති<br>අන්‍යාර්ථ සමාස<br>වර්තමාන/අනතීත කෘදන්ත |
| II ඔවුනොවුන්<br>බලමින්<br>ප්‍රයෝජනවත් | සන්ධි<br>ක්‍රියා<br>තද්ධිත | ස්වර සන්ධිය<br>මිශ්‍ර ක්‍රියා/මුසු කිරිය<br>ඇත යන අර්ථයෙහි<br>/අස්ත්‍යාර්ථයෙහි |
| **III** සුමිහිරි<br>සිතියම්<br>මෙන් | උපසර්ග<br>සන්ධි<br>නිපාත | වඩා යන අර්ථයේ මහා යන අර්ථයේ අධික යන අර්ථයේ භූෂණාර්ථයේ/ගාත්‍රාදේශ සන්ධිය /උපමාවාචී නිපාත |
| **IV** අභිවෘද්ධිය<br>කරන<br>රකිත්වා | උපසර්ග<br>කෘදන්ත<br>ක්‍රියා | බහුල අර්ථය උසස් අර්ථය/ වර්තමාන කර්මකාරක කෘදන්ත ආශීර්වාද ක්‍රියා /ප්‍රාර්ථනා ක්‍රියා |
| V වෙද්දී<br>නියමුවාණෝ<br>බැතින් | ක්‍රියා<br>තද්ධිත<br>සන්ධි | කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා<br>ගෞරවාර්ථයෙහි<br>පරස්වර ලෝප සන්ධිය (ප්‍රකෘති ප්‍රත්‍ය සංයෝගය) |

(ලකුණු 3×5 = 15)

(6) (අ) I මඩුලු  IV මණ්ඩලය



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

II බස V ප්‍රධාන

III භාෂා VI ප්‍රදානෝත්සවය (ලකුණු 1/2 ×6 = 03)

(ආ) I උච්චාවස්ථාව IV නැටිල්ල

II නොයෙන V තුම්මහක්

III අන්වේෂණ VI දැමුණ (ලකුණු 1/2 ×6 = 03)

(ඉ) I පැදුරෙන් - අවධි විභක්ති II තරුණයනි - ආලපන

කුරුල්ලෙකු - කර්ම විභක්ති රටෙහි - ආධාර

III මාධ්‍යවේදින් - කර්තෘ විභක්ති

ජනතාවට - සම්ප්‍රදාන විභක්ති (ලකුණු 1/2 ×6 = 03)

(ඊ)I ''යෝදියේ නුඹට ඔල්මාදෙ ද? අම්මා බෙරිහන් දුන්නාය.

II අයියෝ ! ළමයගේ අනාගතේ ම ඉවරයි.

III උදේ 9 30 ට පිටත්ව ගියේය. (ලකුණු 1/2 ×6 = 03)

(උ) I ඉරිදා දින විදුලිය කපන බව විදුලිබල මණ්ඩලය ප්‍රදේශවාසීන්ට නිවේදනය කළේය.

II අඹ ගසින් බසින ලෙස අක්කා මල්ලීට පැවසුවාය.

III ඔවුන් /තමන් විභාගය සමත් වන බව උසස් පෙළ ළමයි කියා සිටියහ. (ලකුණු 1/2×6 = 03)

(7) I නවාතැන් , පර්යේෂණ, පහසුකම්, ශීඝ්‍රයෙන්, හැරීම

II ග්‍රාමෝදය - ඇලපිල්ල , රකාරාංශය, කොම්බුව, ඇලපිල්ල හා හල්කිරීම/දීර්ඝත්ව සලකුණ

විදේශීය - කෙටි ඉස්පිල්ල , කොම්බුව , හල් කිරීම/ දීර්ඝත්ව සලකුණ හා ඉස්පිල්ල

සිදු කරයි - කෙටි ඉස්පිල්ල , කෙටි පාපිල්ල හා කෙටි ඉස්පිල්ල

III 1 ශීඝ්‍රයෙන් 2 සහය 3 සංඛ්‍යාව

IV ග්‍රාමෝදය ග්‍රාම + උදය ස්වරාදේශ සන්ධිය

ඔවුනොවුන් ඔවුන් + ඔවුන් ස්වර සන්ධිය

විස්සම් විස් + කම් පූර්ව රූප සන්ධිය

V පූර්ව ක්‍රියා - රැක

මිශ්‍ර ක්‍රියා - සලසමින්

වර්තමාන කාල ඒකවචන ක්‍රියාවක් සිදු කරයි (ලකුණු 3 ×5 = 15 යි)

(8) කෙටි සටහන් සඳහා ලකුණු

හැඳින්වීමට ලකුණු 03 යි

උදාහරණ දෙකට ලකුණු 02 යි (ලකුණු 5 ×3 = 15 යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources